# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 8,329 — 1937ක්වූ නොවැම්බර් මස 5 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංගනීති.

L. D.—B. 269/31

වර්ෂ 1896යේ අංක 13 දරණ වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයි.

කතරගම ඉල්මහ කාච්චි මඩුගලාය සම්බන්ධ නියෝග.

"වන්දනා ගමන් පිළිබඳ ආඥාපණත" යයි නම්කරණලද වර්ෂ 1896යේ අංක 13 දරණ ආඥාපණතේ 1වන වගන්තියෙන් හා වර්ෂ 1931යේ ලංකා රාජ්‍ය සභාව සම්බන්ධ නියෝග වල 93වන වගන්තියෙන් බලයලත් ප්‍රකාර 1937යේ නොවැම්බර් මස පවත්නණු ලබන ඉල්මහ කාච්චි මඩුගලාය සම්බන්ධ සිරිත් පරිදි කතරගමට කෙරෙන වන්දනා ගමන් ආරම්භයෙහිම මෙහි පහත දක්වෙන නියෝග මෙම දැන්වීම වයින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වන ඇන්ඩෘ කොල්ඩිකට් නමැති මම විසින් පණවනලදී.

ඒ. කොල්ඩිකට්,
ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ.

1937යේ නොවැම්බර් මස 2වන දින.

---

නියෝග.

1. මේ නියෝග සඳහා "වාඩිය" යයි සලකනු ලබන්නේ :—

(අ) කතරගම මහදේවාලයේ සිට සැම දෙසින්ම හැතැප්ම භාගයක් ඇතුළත ප්‍රදේශය ; හා

(ආ) සෙල්ලකතරගම පිහිටි පිල්ලයාර් කෝවිලේ සිට හැතැප්ම කාලක් ඇතුළත ප්‍රදේශයද වේ.

2. (අ) කතරගම ඉල්මහ කාච්චි මඩුගලාය හා කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය වර්ෂ 1937යේ නොවැම්බර් මස 16වන දින පටන් එම මස 18වැනි දින අවසානය දක්වා දවස් 3ක් සීමාකළයුතු බැවින් එය මෙයින් මෙසේ සීමා කරණු ලැබේ.

(ආ) කිසිම වන්දනාකරුවෙක් නොවැම්බර් මස 16වෙනි දිනට පෙර වාඩියට පැමිණීමද එම මස 18වෙනි දිනට පසු වාඩියේ නැවතීමද නොකළ යුතුයි.

3. මෙම වාඩියේ කටයුතු ඌවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ සාමාන්‍ය පරිපාලනය පිට හා වෛද්‍ය මූලාදෑනි කෙනෙකුගේ සහ පොලිස් මූලාදෑනියෙකුගේත් ආධාරලත් "ස්ථාන පාලක නිලධාරීතැන" යයි නම්කරණලද මූලාදෑනි කෙනෙකුගේ තීක්ෂණ පරිපාලනය පිටද පවතී.

4. (1) ස්ථාන පාලක නිලධාරීතැනට කතරගමදීද කතරගමට යන එන අතරමගදීද, පහත දක්වෙන නියෝග සැලැස්වීමට බලය තිබේ :—

(අ) සේදීමට හා නෑමටද, වතුර ඇදගන බීමටද, ශරීර කෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශේෂ ප්‍රයෝජනයට විශේෂ ස්ථාන නියමකිරීමටද ;

(ආ) එක් එක් වර්ගයේ වන්දනාකාරයින්ට නැවතීමට ස්ථාන නියමකිරීමටද ;

(ඉ) යම්කිසි වන්දනාකාර කාණ්ඩයක් විසින් යායුතු මාර්ග නියම්කිරීමටද ;

(ඊ) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදාදීම හසුරුවීමටද ;

(උ) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනය පිණිස වාසස්ථාන වෙන්කොට නියම්කිරීමටද ඔවුන් සමග ගණුදෙනු කථාබස් තහනම්කිරීමට හා ඔවුන්ට යෑමට තුන්පුරුවන්නම් නවත්වාගැනීමටද බලය තිබේ.

(2) ස්ථාන පාලක නිලධාරීතැන විසින් මෙහි ඉහත 1වෙනි වගන්තියට සඳහන් කටයුතු සම්බන්ධව නීතිප්‍රකාර දෙනු ලබන කිසිම නියෝගයකට කිසිවෙක් අකීකරු නොවිය යුතුයි.

5. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ ශරීර කෘත්‍යයන් සඳහා විශේෂයෙන් සලස්වා තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය ස්ථානයක කිසිවෙකු විසින් මලමුත්‍ර පහකිරීම නොකළ යුතුයි.

6. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ කුණු කසල දැමීමට සලස්වා තිබෙන භාජනවල හෝ ඒ වෙනුවෙන් වෙන්කර තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය කිසිම ස්ථානයක කුණු කසල ආදිය නොදැමිය යුතුයි.

7. ස්ථානපාලක නිලධාරීතැන විසින් ගඟේ නෑමට නියම කරණලද ස්ථානයෙහි හැර ඒට ඉහළින් වාඩියට අයිති සීමාව තුළ කිසිවෙකු විසින් ගඟට බැසීම හෝ නෑම හෝ නොකළ යුතුයි.

### I.—මුල් සිතියමේ නො. A 11.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | වැල්ලගල .. | .. 2 1 15 |

මිට මායිම්—උතුරට ඇස්. ඇම්. පුංචිරාලහාමි විසින් අයිතිකම්කියන වැව්හක්කන්හේන සහ ඇස්. ඇම්. පුන්චිරාල සහ තවත් අය විසින් අයිතිකම්කියන මෙල්ලගලහේන; නැගෙනහිරට ඇස්. ඇම්. පුන්චිරාලහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන වැල්ලගලහේන සහ නො. A 11 දරන මුල් සිතියමේ 3වෙනි බිම්කට්ටිය (ආර්. පීරිස්අප්පුහාමි විසින් අයිතිකම්කියන මුත්තෙට්ටුහේන නොහොත් මෙල්ලගලතුල); දකුණට ඇස්. ඇම්. කිරිබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන වඳකහාගලහේන; බස්නාහිරට ඒ. ඒ. වික්‍රමසිංහ සහ තවත් අය විසින් අයිතිකම්කියන ගලපල්ලේහේන, ඇස්. ඇම්. පුංචිරාලහාමි විසින් අයිතිකම්කියන මැට්ටක්කන්හේන සහ ඇස්. ඇම්. පුංචිරාලහාමි විසින් අයිතිකම්කියන බැම්බක්කන්හේන.

### II.—මුල් සිතියමේ නො. A 11.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 5 | මුත්තෙට්ටුවේහේන .. | .. 0 0 10 |

මිට මායිම්—උතුරට ආර්. පී. අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන මුත්තෙට්ටුහේන (A 11 මුල් සිතියමේ 4 බිම්කට්ටිය); නැගෙනහිරට ආණ්ඩුවේ මුත්තෙට්ටුවේහේන (4,153 මුල් සිතියමේ 1වෙනි බිම්කට්ටිය); දකුණට රුවන්වැල්ල සිට වරකාපොල යන මහපාර; බස්නාහිරට ඇස්. ඇම්. පුංචිරාලහාමි විසින් අයිතිකම් කියන පරෙහේන.

---

### 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනත.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,642 (කෑගල්ල).

මිට යටින් තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩමේ කිසිවක් හෝ ඒ ඉඩමේ යම් කිසි කොටසක් හෝ නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5(1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණු ලබන බවද රජසන්තක ඉඩමක් බව යෙන් ලෙස ඒව කටයුතුකරණ බවද එකී ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1937ක්වූ ඔක්තෝබර් මස 6වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අලුවිහාරේ,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම් කීම ඒ ඉඩමට අයිතිකම් කීම හැටියට බාරගනු ලැබේ.

### උප ලේඛනය.

සබරගමු දිසාවේ කෑගල්ලේ දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ එගොඩපොත පත්තුවේ වාකිරිගල යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම් :—

### මුල් සිතියමේ නො, A 115.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | වාකිරිගලකඳ නොහොත් පිරිවෙන්කඳ .. | 13 2 27 |

මිට මායිම්—උතුරට දිවෙල උඩගම ගම්මායිම සහ පී. සී. සියාතුහාමි විසින් අයිතිකම්කියන ගලහාබඩහේන; නැගෙනහිරට ඒ. පිංහාමි විසින් අයිතිකම්කියන ගලඅද්දරහේන, පී. පිංචිඅප්පුහාමි විසින් අයිතිකම්කියන උඩඅරම්බේවත්ත, ඇස්. ඩින්ගිරි අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කහටගහහේන (වී. පී. 198,361), ඇස්. ඩින්ගිරි අප්පුහාමි සහ තවත්අය විසින් අයිතිකම්කියන කහටගහහේන (වී. පී. 67,612) සහ පී. කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන ගලඅද්දරහේන දකුණට සහ බස්නාහිරට දිවෙලඋඩගම ගම් මායිම.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Kandy No. 260.**—මධ්‍යම දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1937ක්වූ දෙසැම්බර් මස 21වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුකරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතදුම්බර කොරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක් සහ මහනුවර නගර සීමාවතුල පිහිටි බිම්කැබලි 1ක්.

මුල් සිතියමේ නො. 8,527. ගම—ගෙනගැහුවල (පාතදුම්බර කොරළයේ). අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉඩම් බලයටගත් අයගේ නම. | අන්දම. | ප්‍රමාණ, අ. රූ. ප. | බිම්කැබෙල්ලේ සම්පූර්ණ මිල, රු. |
|---|---|---|---|---|---|
| 32 | නිකවබනැන්ණහේන .. | පේරුදෙනියේ පුංචිබංඩා රඹුක්වැල්ල, රඹුක්කන නන්දුමැනිකා නෙක්නකෝන්, ගෙනගැහුවල කුත්තලිංගම්ගේ දූ පාර්වදී, ගෙනගැහුවල වෙල්ලසිනා නඩාර් අයියාකන්දු, ඒ. පිකිරිබංඩා, ඒ. තීන්අම්මා සහ තෙල්දෙනියේ සුප්‍රමනියම් රත්නම් සහ සුප්‍රමනියම් වෙල්ලසියා | හේන | .. 0 2 10 | 8·25* |
| 70 | කුරුවෙනියන්දමේ මුල හේන සහ නිකමබේ හේන | එම .. .. | එම | .. 4 2 18 | 68·52* |
| 65 | ගමගෙදරවත්ත .. | රඹුක්වැල්ලේ ඒකනායකමුදියන්සේලෑ ගමගෙදර පුංචිබංඩා, ඒකනායකමුදියන්සේලෑ ගමගෙදර ලොකුබංඩා සහ උඩගම්පහ සිරිමල්වත්තේ ඒකනායකමුදියන්සේලෑ ගමගෙදර ලොකු මැනිකා | එම | .. 0 2 27 | 6·70* |
| 69 | කොබකපිපිගේහේන .. | රඹුක්වැල්ලේ මැද්දුමාබංඩා වීරසේකර, රඹුක්වැල්ලේ සෝසිත, ගෙනගැහුවල අබේසිංමුදියන්සේලෑ පලිහුමැනිකාගේ උරුමක්කාරයෝ, එච්. ඇම්. දේවගෙදර කලුමැනිකා, එච්. ඇම්. සී. කලුබංඩා සහ රඹුක්වැල්ලේ වීරසේකර පුංචිබංඩා | එම | .. 3 2 38 | 37·40* |
| | | ගම—වැදිගම්මැද්ද (පාතදුම්බර කොරළයේ). | | | |
| 128 | අංබිසිංගෙදරහේන .. | (1) ගෙනගැහුවල ඒ. ඇම්. ඒ. හිංගිරිඅම්මා, (2) ඒ. ඇම්. ඒ. රත්බංඩා, (3) ඒ. ඇම්. ඒ. සෙනෙවිරත්න, (4) ඒ. ඇම්. ඒ. අබේරත්න, (5) ඒ. ඇම්. ඒ. හිංබංඩා, (6) ඒ. ඇම්. ඒ. කොයින්මැනිකා, (7) ඒ. ඇම්. ඒ. මැද්දුමාබංඩා, (8) ඒ. ඇම්. ඒ. උක්කුබංඩා, (9) ඒ. ඇම්. ඒ. බංඩාරමැනිකා, (10) ඒ. ඇම්. ඒ. මුදියන්සේ සහ (11) ඒ. ඇම්. ඒ. හිංගිරිඅම්මා | හේන | .. 2 1 0 | 22·50* |

| නො. | ඉඩමේ නම. | ඉඩම් මිලයට හක් අයගේ නම්. | අන්දම. | මහත, | අ. රූ. ප. | | | හිමිකෑමෙල්ලේ සම්පූර්ණ මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | ගම—ගෙහනගැහුවල (පාතදුම්බර කොඨාසයේ). | | | | | | |
| 164 | අඹේසිංගෙදරහේන .. | (1) ගෙහනගැහුවල ඒ. ඇම්. ඒ. හිංගිරිඅම්මා, (2) ඒ. ඇම්. ඒ. රම්බංඩා, (3) ඒ. ඇම්. ඒ. පෙහෙනති රත්න, (4) ඒ. ඇම්. ඒ. අඹේරත්න, (5) ඒ. ඇම්. ඒ. මැද්දුමාබංඩා, (6) ඒ. ඇම්. ඒ. උක්කු බංඩා, (7) ඒ. ඇම්. ඒ. බංඩාරමැණිකා, (8) ඒ. ඇම්. ඒ. මුදියන්සේ, (9) ඒ. ඇම්. ඒ. හිංගිරි අම්මා, (10) ඒ. ඇම්. ඒ. හීන්බංඩා සහ (11) ඒ. ඇම්. ඒ. කොයිත් මැණිකා | හේන | .. | 0 | 2 | 22 | 6·38* |
| 233 | එම .. | එම .. .. | එම | .. | 3 | 2 | 30 | 36·88* |
| | | මුල් සිතියමේ නො. A 102. ගම—වැදිගම්මැද්ද (පාතදුම්බර කොඨාසයේ). | | | | | | |
| 12 | ඇල්ලමඩුගේහේන .. | (1) ගෙහනගැහුවල අඹේසිංහමුදියන්සේලෑ හීංබංඩා, (2) අඹේසිංහමුදියන්සේලෑ කොයිත් මැණිකා, (3) අඹේසිංහමුදියන්සේලෑ රම්මැණිකා, (4) අඹේසිංහමුදියන්සේලෑ පලිඟුමැණිකා, (5) අඹේසිංහමුදියන්සේලෑ හිංගිරිබංඩා, (6) අඹේසිංහමුදියන්සේලෑ රම්බංඩා, (7) අඹේසිංහමුදියන්සේලෑ මැද්දුමබංඩා සහ (8) අඹේසිංහමුදියන්සේලෑ පිකිරිමැණිකා | හේන | .. | 3 | 1 | 3 | 32·70* |
| | | මුල් සිත්යමේ නො. 9,202. ගම—මහනුවර නාගරික සභාව තුල පිහිටි ගුරුප්පොල. | | | | | | |
| 3 | දෙඹවගස්පිටියේ මික්ක, වරිපනම් නො. 31 කොටසක් | (1) ගුරුප්පොල කැලෑකෝරාලගෙදර රංහාමි, (2) කැලෑකෝරාලගෙදර කිරිහාමි, (3) කැලෑකෝරාලගෙදර පුංචිමැණිකා, (4) කැලෑකෝරාලගෙදර රම්මැණිකා සහ (5) කැලෑකෝරාලගෙදර කිරිමැණිකා | වත්ත | .. | 0 | 0 | 18·2 | 48* |

* පිකුණුහලද ඉඩම්වලට ගෙවියයුතු මුදල් නොගෙවීම නිසා නැවත විකිණීම පිණිසයි. මේ හිමිකාවිරීවලට ගෙවිය යුතු සම්පූර්ණ මුදල මෙහි ඉපන්තුම්කර තිබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නෑන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

පී. කුමාරසවාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ සාමයුත්තකාර, ඒනම්:—මඩම්ල සිට හෝරගොල්ලට යන ගම්සහා පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කොටසේ කරසිටිනා පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 515. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිකන්පත්තුවේ රැකෝපත්තුකෝරළේ පංගු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | කොළුම්පස්වත්ත .. | පොල්වත්ත .. | සීමාසහිත සිංලාත් යොකහාපි කොම්පැනිය .. | 0 | 0 | 5·5 |
| 2 | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 2·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතාවූ සෑම දෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1938ක්වූ ජනවාරි මස 12වෙනි දින පෙරවරු 10 පැයට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒම ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 2වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. එච්. බී. මැන්ඩර්ස්;
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 822

### ආණ්ඩුවේ බදු විකිණීම.

මෙහි සඳහන් ලේඛනයේ දක්වන ආණ්ඩුවේ බදු පහත දක්වන කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට විකිණීම සඳහා ඉල්ලුම් පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාර ගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මුද්‍රකරණලද මෙම ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 26වෙනි සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙණ එදිනදී කඩාබලනු ලැබේ. ඉල්ලුම්පත්‍ර කැඩෑබව බප්පුවීමට ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ ඉල්ලුම් කරන්නා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටිය යුතුයි. ලේඛනයේ දෙවෙනි කොටුවේ දක්වන ප්‍රකාර ඉල්ලනු ලබන බද්දේ නම පිටකවරවල සලකුනුකොට ඉල්ලුම්පත්‍ර නොහොත් "වැන්ඩර්ස්" එක එක බද්දට වෙන් වෙන් වශයෙන් එවිය යුතුයි.

3. බදුමිල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

4. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් කානු, මායිම්ගල් ආදිය වෙනස් කරන්ටවත් ගස්වල එල ද්‍රව්‍ය හැර වෙන කිසියම් දෙයක් ඉඩමෙන් පිට ගෙනයෑමටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

5. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ බද්ද යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැනුම් කාරයාට අවසර නැත.

6. ගැණුම්කාරයා විසින් ඉඩම පිරිසිදුව සහ හොඳකාර යෙන් තබාගැනීමටත් පලාත් ආණ්ඩු සභාවේ ආඥාපණත් අනුව ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද සියලුම වරිපනම් ගෙවන්ටත් ඕනෑය. තවද බදුකාරයා විසින් 1938 ජනවාරි සහ ජූනි යන මාසවලදී මේ බද්දට ඇතුළත් ඉඩම්වල (ඇලමහට අයත් තීරුව සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මගින් පාලනයකරන ඉඩම් කැබලි හැර ඉතිරි බිමෙහි) ලොකු හා හීන් කැලෑව ශුද්ධකොට, එසේ කළබවට කොළඹ උතුරු කොඨාසයේ දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගෙන් සහතිකයක් ලබාගත යුතුයි.

7. මුලු ඉඩම හෝ, ඉඩමෙන් යම් කොටසක් හෝ, එහි වැවෙන ගස් ආදිය හෝ ආණ්ඩුවට ඕනෑකලොත්, සුමානයක් කල් දැන්වීම එවැනි ඉඩම හෝ ඉඩම් කොටස හෝ ගස් ආදිය හෝ ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්ට යෙදෙන ඉඩමට, ඉඩම් කොටසට හෝ ගස්වලට ගෙවන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගත වෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවනු ලැබේ.

8. ඉහත සඳහන් කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් හෝ ගෙවලින් අහක්කර නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

9. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඩබ්ලිව්. ඊ. ගොඩ්ෆ්‍රේ,
බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉහතකී බදුවල විස්තර ලේඛනය.

| 1. ඛණ්ඩය නො. | 2. බද්දේ නම. | 3. පිහිටීම. |
|---|---|---|
| L H 822 | දෙහිවල සහ වැල්ලවත්තේ ඇලමෝදරවල් අතර ඇලට යාකර තිබෙන ආණ්ඩුවේ ඉඩම් තීරුවේ තිබෙන පොල්ගස් 204, කොස්ගස් 12 සහ පුවක් ගස් 5ගේ එලදාව ප්‍රයෝජනය ගැනීම | කොළඹ නාගරික සභාවට අයිති වැල්ලවත්ත කොට්ඨාසය |
| L H 822A | තුන්මෝදර සිට දෙහිවල මෝදර දක්වා ඇලට යාකර තිබෙන ආණ්ඩුවේ ඉඩම් තීරුවෙහි තිබෙන පොල්ගස් 259, කොස්ගස් 12 සහ පුවක්ගස් 20 එලදාව ප්‍රයෝජනය ගැනීම | දෙහිවල, කළුබෝවිල සහ කිරිල්ලපොනේ (මෙයින් කොටසක් දෙහිවල–ගල්කිස්සේ නාගරික දිස්ත්‍රික් සභාවටත් (යූ. ඩී. සී.) ඉතිරි කොටස කෝට්ටේ නාගරික දිස්ත්‍රික් සභාවටත් අයිතිවේ) |

මෙහි පහත දක්වෙන ඉඩම් කොටස් ඉහත සඳහන්කළ බදු ඉඩම්වලට අයිතිනොවේ :—

(1) ප්‍රසිඩ වෑඩංදපාතිමේන්තුවේ උවමනාකම් සඳහා වෙන්කර තිබෙන වැල්ලවත්තේ විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

(2) කේ. එච්. සියදොරිස්අප්පු යන අයට බදුදී තිබෙන අංක 3,385 දරන මූල් සිතියමේ පෙනෙන ඉඩම් කොටස්.

(3) කොළඹ නාගරික සභාවට බදුදී තිබෙන කිරිල්ලපොනේ පාලම සමීපයෙහි පිහිටි අංක 15,556 දරන මූල් සිතියමේ පෙනෙන ඉඩම.

(4) කේ. එච්. සියදොරිස්අප්පු යන අයට බදුදී තිබෙන කිරිල්ලපොනේ පාලම සමීපයෙහි පිහිටි තොටුපොළ.

(5) ඊ. ඒ. එච්. සිල්වා යන අයට බදුදී තිබෙන කිරිල්ලපොනේ පාලම සමීපයෙහි පිහිටි තොටුපොළ.

(6) පාඨශාලාවක් සහ මිනීකරත්ත මඩුවක් සෑදීමට අසරණධාර රෙබ්බ සමිතියට බදුදී තිබෙන විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

(7) කේ. සී. පෙරේරා යන අයට බදුදී තිබෙන විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

L H 839

**ආණ්ඩුවේ ඉඩම්වල තිබෙන ගෙය් සහ රේන්දපලවල් බදුදීම.**

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 26වෙනි සිකුරාදා දවල් 11 වෙනතුරු කොළඹ කච්චේරියේදී බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට අවුරුද්දක නාරුගේන්පිට රේන්දපලේ බද්ද මෙහි පහත තිබෙන කොන්දේසිවලට යටත්ව විකිණීම පිණිස මුද්‍රකරණලද වැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

1. බදුමුදල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගොඩනැගිලි වෙනස්කරන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ කිසිම කොටසක් යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදුදෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

4. බදු ඉඩමේ වැට බඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකලොත් එසේ කිරීමට බදුකාරයා බැඳිලාය.

5. ගැනුම්කාරයා විසින් ඉඩම සුද්දෙන් සහ හොඳකාරයෙන් තබාගන්ටවත් නාගරික සභාවේ අණපණත් හැටියට ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද සියලුම වරිපණම් ගෙවන්ටත් ඕනෑය.

6. බදු ඉඩමෙන් ගෝරණ, වැලි ආදියක් විකුණන්ටවත් ගෙනයන්ටවත් ගැනුම්කාරයාට තහනම්ය. තවද එම ඉඩමට අලාභහානිවෙන කිසි ක්‍රියාවක් කිරීමත් තහනම්ය.

7. මුළු ඉඩම හෝ ඉඩමෙන් හෝ ගෙවලින් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකලොත් සුමානයක් කල්දුන්විට එවැනි ඉඩම හෝ ඉඩම් හෝ ගෙවල් කොටස ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම හෝ ගෙවල් කොටසට ගෙවන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගෙවන්ට තිබෙන කාලයට බදු මුදලින් අපසු ගෙවන්ට සෙදෙනවා ඇත.

8. දැනට පවතින ගොඩනැගිලි හැර වෙන යම් මඩුවක් හෝ තාවකාලික ගොඩනැගිල්ලක්වත් වෙළඳම්පලක්වත් ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් පලමුවෙන් ලබාගත් අවසරයක් නැතුව ඇතිකිරීම තහනම්.

9. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් හෝ ගෙවලින් අහක්කර නැවත භූක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

10. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඩබ්ලිව්. ඊ. ගොඩ්ෆ්‍රේ,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේය.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

**රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912ගේ අංක 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීම.**

කෑගල්ල දිස්ත්‍රික්කයේ 1937 අවුරුද්ද තුළ අරක්කු, රා සහ රටබීම විකිණීම සම්බන්ධව කැමැත්ත ගැන්මේ දැන්වීමයි.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 14වෙනි දින අංක 146 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ 6වෙනි වගන්තිය යටතේ සංශෝධනය කරනලද වර්ෂ 1928ක්වූ අගෝස්තු මස 31වෙනි දින අංක 160 දරණ දැන්වීම සහ ඊට පසුව ප්‍රසිද්ධකරනලද, මත්පැන් සම්බන්ධ අංක 187, 194, 221, 225 සහ 231 දරණ දැන්වීම් කාරණකොටගෙනද ලැබුණු බලය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් මෙහි පහත සඳහන් තැබෑරුම්වලින් ප්‍රයෝජන ලබන ගම්වල අයවලුන් ගෙන් සිංස්ට හැට ගැනෙන එම තැබෑරුම් (වර්ෂ 1938ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින සිට) විවෘතකිරීමට කැමතිද යන බව දැනගැනීම සඳහා කැමැත්තදෙන අයවලුන් ගණන්ගැනීමට මෙහි පහත සඳහන් දින, වේලාවල් සහ ස්ථානද නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශකරනු ලැබේ.

වේලාව: උදේ 8 සිට දවල් 12ට දක්වාද, දවල් 1සේ සිට හවස 6 දක්වාද.

| අංකය. | තැබෑරුමේ නම. | දිනය. | ස්ථානය. | ඡන්දය දෙන පලාතට අයිතිගම්. |
|---|---|---|---|---|
| 1 | අගුරුවැල්ලේ රා සහ අරක්කු තැබෑරුම | 4. 12. 37.. | අගුරුවැල්ලේ වලිස් කෝඩැල්ල ගෙදර සොයිරුවේ වත්තේ තිබෙන කඩේ කාමරයක් | අගුරුවැල්ල, දෙරනුව, මුදුනමුව, කරවිලදෙනිය, සපන්වල, රුවන්වැල්ල, ගල්පාත, හෝනගොඩ, ඉඹුලාන, සියඹලාවල, කඩඳුර, ගැටඹුරුන, බෙන්තෙච්ගෙදර, මොරවත්ත, එරපොලඹිල්ල, බෝපැත්ත සහ හෝකඹුව |
| 2 | දෙල්ඹලුව බීර තාප්පුව | 11. 12. 37.. | දෙල්ඹලුවේ ගොඩැල්ලවත්තේ තිබෙන ගොඩනැගිල්ල | දෙල්ඹලුව, දිගල, දික්ඇල්ල, වල්පොල, නාවෙල, වත්තේගෙදර, මලන්දෙනිය, පාදුක්ගම, බොරලන්කඩ, වල්පොලවත්ත, සපුමල්කන්දවත්ත, ඉලුක්තැන්නවත්ත, දිගලවත්ත සහ දෙල්ඹලුවවත්ත |

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 1වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අලුවිහාරේ,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

---

**සුප්‍රීම් උසාවියේ දැන්වීමයි.**

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් උතුරු මධ්‍යම දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 10 පැය පටන් මහනුවර මගුල් මඩුවේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවක් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 1වෙනි දින
අනුරාධපුර පිස්කල් කන්තෝරුවේදීය.

ලයනල් ෆර්ඩිනැන්ඩ්,
උ. ම. දි. උප පිස්කල්තුමා වෙනුවට.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.